## කරන්දෙණිය ප්‍රාදේශීය සභාව
## 2023 ජනවාරි මස මාසික මහ සභා රැස්වීමේ වාර්තාව

දිනය :-2023.01.10
ආරම්භය :-පෙ.ව 9.00
ස්ථානය :-කරන්දෙණිය ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව

එදින සහභාගීත්වය:-

| | |
|---|---|
| 01.ගාමිණී අමරවංශ මුණුගොඩ | ගරු සභාපති |
| 02.එස්.පී නිමල් බන්දු මැතිතුමා | ගරු උප සභාපති |
| 03.එම්.එස්.කපිල කුමාර මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 04. අජිත් කුමාර කරුණාතුංග මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 05.ගාල්ලගේ ලහිරු සඳරුවන් සුරවීර මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 06. ඩී.කේ.ජීවන්ති වීරසිංහ මැතිනිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 07.බී.එච්.ශ්‍යාමා නිශාන්ති විමලවීර මැතිනිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 08. පී.එච්. සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 09. සමීර චතුරංග ආරියරත්න මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 10.ටී.එච්.කමල් හේවගේ මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 11.රම්‍ය ශ්‍රී විජේතුංග මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 12. .එච්.චම්පික කුෂාන් ගුණසිංහ මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 13. එන්.පී.සුහසිංහ මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 14.මොහොමඩ් කියාස් මොහොමඩ් සිරාස් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 15.චන්ද්‍රිකා කාන්ති වීරසිංහ මැතිනිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 16.ශ්‍රියාණි පුංචිහේවා මැතිනිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 17. ඒ.ඒ.සරත් ගුණරත්න මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 18.ඕ.කේ.ධම්මික සුසන්ත මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 19.කේ.ඩී.බන්දුසිරි මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 20.ඒ.ජී.හර්ෂණී දීපිකා මැතිනිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීම

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා

2023 ජනවාරි මස මාසික සභා රැස්වීමට පැමිණි සියළුම ගරු මන්ත්‍රීවරු සහ මන්ත්‍රීවරියන් වගේම කාර්ය මණ්ඩලයත් සහ මාධ්‍යවේදීන් සියළුම දෙනාවත් ගෞරවයෙන් පිළිගනු ලබනවා. අද දින න්‍යායපත්‍රානුකූලව සභාවේ කටයුතු ආරම්භ කරමු.

## 2022 දෙසැම්බර් මස මාසික සභා වාර්තාව සම්මත කිරීම

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

පසුගිය සභා වාර්තාව කියවුවා සේ සලකා 2022 දෙසැම්බර් මස මාසික සභා වාර්තාවේ අඩු පාඩු හා වැරදි තිබේනම් එම අඩුපාඩු පෙන්වා දී අඩු පාඩු නොමැතිනම් සභා වාර්තාව සම්මත කරන ලෙසට මම ඉල්ලා සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එච්.ශ්‍යාමා නිශාන්ති විමලවීර මැතිනිය</u>

සියලු දෙනාටම සුභ අලුත් අවුරුද්දක් ප්‍රාර්ථනා කරනවා. 2022 දෙසැම්බර් මස සභා වාර්තාවේ සංශෝධන නොමැති බැවින් එම සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රම්‍ය ශ්‍රී විජේතුංග මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

2022 දෙසැම්බර් මස සභා වාර්තාවේ සංශෝධන නොමැති බැවින් එම සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එච්.ශ්‍යාමා නිශාන්ති විමලවීර මැතිනිය විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රම්‍ය ශ්‍රී විජේතුංග මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන

අද අපි සහභාගී වෙන්නේ 2023 නව වසරෙ නව සභා වාරයට.සියළුම දෙනාට සුභ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.කුමන මොහොතක සභාව විසුරුවාවිද කියලා කියන්න බෑ.ඒ නිසා අපි සභා සම්මත කරගත් යෝජනා කිහිපයක්ම කඩිනමින් ක්‍රියාත්මක කළා.ඌරගස්මංහන්දිය නව වෙළඳ සංකීර්ණය විවෘත කළා.මහජ්දණ්ඩ පොදු වැසිකිළිය විවෘත කළා. අඩු ආදායම්ලාභී දරුවන්ට පොත් බෙදා දීම සාර්ථකව අවසන් කරනු ලැබුවා. ඒ වගේම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී පී.එච්.චම්පික කුෂාන් ගුණසිංහ මැතිතුමාගේ දරුවා අසනීප වීම නිසා පැමිණීම ප්‍රමාද වන බවට දැනුම් දී තිබෙනවා.අද දින න්‍යාය පත්‍රානුකූලව ඉදිරි කටයුතු කරගෙන යන්න සියළුම දෙනාගේ සහයෝගය මම බලාපොරොත්තු වෙනවා.

## 03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව වෙත ඉදිරිපත් කිරීම.

03.01. හිපන්කන්ද ශ්‍රී පාද විහාරය සඳහා " වතුර මෝටරයක් සහ බට ලබා ගැනීම සම්බන්ධවයි. " යන මැයෙන් යුතුව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදි.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

මෙහි නීත්‍යානුකූල තත්වය බලලා කටයුතු කරමු.

03.02."වෑන් රථගාල පවතින ස්ථානය වෙනස් කිරීම සඳහා "යන මැයෙන් යුතුව සභාපති, රියදුරු සංගමය , ඌරගස්මංහන්දිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදි.

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා

මේ ලිපියෙන් ඉල්ලන්නේ ඌරගස්මංහන්දියේ වට රවුම සැකසීම සඳහා ඉවත් කරන ලද අනවසර කඩ කඩකාමර තිබූ ස්ථානය. ගරු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත අනුව මේ සඳහා අවස්ථාව ලබාදිය හැකියි. අපි මේ පිළිබඳව වෙනත් කරුණුයටතේ සාකච්ඡා කරමු.

03.03."කොටවෙල ප්‍රජා ශාලාවේ යටිතල පහසුකම් සංවර්ධනය කර දෙන මෙන් ඉල්ලා සිටීම " යන මැයෙන් යුතුව ප්‍රධානාචාර්ය, ශ්‍රී නාලන්දා දහම් පාසල , කොටවෙල, කරන්දෙණිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදි.

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා

අපි මේක සොයලා බලලා කටයුතු කරමු.

03.04." සභා අනුමැතිය ලබා ගැනිම "යන මැයෙන් යුතුව ප්‍රජා සංවර්ධන නිලධාරි විසින් ඉදිරිපත් කරන ලද පෙර පාසල් දෙකෙහි ළමුන් සඳහා නිළ ඇඳුම් ලබා දීමේ ලිපිය සභා ගත කරන ලදි.

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා

දළ ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරලා තියෙනවා.අපි මෙම මුදල නිදහස් කරමු.

03.05." ස්ථාවර කමිටු පවත්වාගන යාම සම්බන්ධවයි "යන මැයෙන් යුතුව ප්‍රජාසංවර්ධන නිලධාරි විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදි.

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා

ස්ථාවර කමිටු පවත්වාගෙන නොයාම සම්බන්ධව විගණනයට ලක්වෙලා තියෙන නිසා ඒ සඳහා සුදුසු දිනයක් ඉල්ලලා තියෙනවා. මුදල් කමිටුව විතරයි නිසියාකාරව ක්‍රියාත්මක වෙන්නේ. පරිසර කිමිටුවත් දින කිපහිපයක් පැවැත්වූවා. සෘජුවම ඵලදායීතාවයක් පේන්නේ නැති නිසා තමයි මේවා නිසියාකාරව ක්‍රියාත්මක නොවෙන්නේ.ලැබෙන ලිපි අනුව සුදුසු දිනයක් තීරණය කරලා මන්ත්‍රීවරුන්ට දැන්වීම අපි ප්‍රජා සංවර්ධන නිලධාරිට භාර දෙමු.

03.06 "නිවාස සහනාධාරයක් ඉල්ලුම් කිරිම සම්බන්ධව" යන මැයෙන් යුතුව දික්හේන, ඌරගස්මංහන්දිය ලිපිනයේ පදිංචි කාරියවසම් අයේෂා උදයංගනී මධුමාලි මිය විසින් ඉදිරිපත් කරන ලද 2022.12.01 දිනැති ලිපිය සභා ගත කරන ලදි.

03.07 "නිවාස සහනාධාරයක් ඉල්ලුම් කිරිම සම්බන්ධව" යන මැයෙන් යුතුව දික්හේන, ඌරගස්මංහන්දිය ලිපිනයේ පදිංචි දිනේෂා උදයංති සඳමාලි කාරියවසම් මිය විසින් ඉදිරිපත් කරන ලද 2022.12.01 දිනැති ලිපිය සභා ගත කරන ලදි.

03.08 "වහල සාදාගැනීම සම්බන්ධවයි" යන මැයෙන් යුතුව අංක 446, කයිලත්ත, ඌරගස්මංහන්දිය ලිපිනයේ පදිංචි ටී.එච්.සෝමලතා මිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදි.

03.09 "ප්‍රජා ශාලාව පිළිබඳ" යන මැයෙන් යුතුව 39 C ග්‍රාමනිළධාරී වසමේ පිහිටි තේවත්තහංදිය ප්‍රජා ශාලාවේ ප්‍රතිසංස්කරණ කිහිපයක් ඇති බවට එහි ග්‍රාම නිළධාරි විසින් ඉදිරිපත් කරන ලද 2023.01.08 දිනැති ලිපිය සභා ගත කරන ලදි.

03.10. "සැබෑ වැඩ ලෝකයේ පුහුණුව සඳහා ආධුනිකාවන් යොමු කිරිම " යන මැයෙන් යුතුව ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය විසින් තොරතුරු හා සන්නිවේදන පාඨමාලාව හැදෑරූ රවිනි රසාංජලී ජයවීර අප ආයතනයේ පුහුණුව සඳහා අනුයුක්ත කිරිම සඳහා කරන ලද 2023.01.09 දිනැති ඉල්ලීම් ලිපිය සභා ගත කරන ලදි.

03.11. "ප්‍රජා ශාලාවට විදුලි සැපයුම ලබා ගැනීම සඳහා " යන මැයෙන් යුතුව 39 Cඌරගස්මංහන්දිය නැගෙනහිර ග්‍රාමනිළධාරී වසමේ පිහිටි ප්‍රජා ශාලාවට විදුලිය ලබා ගැනීම සඳහා එහි වැඩ බලන ග්‍රාම නිළධාරී විසින් ඉදිරිපත් කරන ලද 2022.10.03 දිනැති ලිපිය සභා ගත කරන ලදී.

03.12."ප්‍රාදේශීය සභා අරමුදලෙන් සමිතියට අවශ්‍ය උපකරණ ඉල්ලීම සම්බන්ධවයි. " යන මැයෙන් යුතුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශ්‍රියානි පුංචි හේවා මැතිණිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදී.

03.13."බස් හෝල්ට් එකක් ඉදි කිරීමේ ඉල්ලුම් පත්‍රය " යන මැයෙන් යුතුව අයි.ඩී. ජනදාස ස්ටීවන් මහතා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදී.

ගරු සභාපති ගාමිණි අමරවංශ මුණුගොඩ මැතිතුමා

මෙම මාර්ගය අයත්වෙන්නේ මාර්ගස්ථ ප්‍රවාහනඅධිකාරියට හා ප්‍රාදේශීය මාර්ග සංවර්ධන අධිකාරියට නිසා අපේ විරුද්ධත්වයක් නැහැයි කියලා දැනුවත්කරමු.

03.14."ටෙන්ට් අඩි 40ත් පුටු 50 ලබා ගැනීම සම්බන්ධව. " යන මැයෙන් යුතුව ජන සුව ප්‍රජා සත්කාර පදනම විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදී.

03.15."දහම් පාසලට හිඟව ඇති භාණ්ඩ ලබා ගැනීම සඳහා " යන මැයෙන් යුතුව ප්‍රධානාචාර්ය, ශ්‍රී සීලාලංකාර දහම් පාසල , මුල්කැටියාතොට , කරන්දෙණිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදී.

03.16."රාජ්‍ය ආයතන තුළ යාවත්කාලීන වූ දත්ත පද්ධති පවත්වාගන යාම හා අන්තර් රාජ්‍ය සන්නිවේදනය කාර්යක්ෂම කිරීම. " යන මැයෙන් යුතුව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් , දකුණු පළාත ගේ අංක හා CSS/11/6/3 හා 2022.11.25 දිනැති ලිපිය සභා ගත කරන ලදී.

03.17."ඌරගස්මංහන්දිය ඉදිකරමින් පවතින දෙමහල් වෙළඳ සංකීර්ණයේ තුන්වෙනි මහල අප විසින් එය ඉදිකර උපකාරක පන්ති පවත්වාගන යන ස්ථානයක්පැවැත්වීමට අවසර ලබා ගැනීමසඳහා . " යන මැයෙන් යුතුව කැරැකැටිය, ඌරගස්මංහන්දිය පදිංචි කේ. ඩී. අයි. සුභාශිනි විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදී.

03.18."ටෙන්ට් පුටු ලබා ගැනීම සඳහා " යන මැයෙන් යුතුව සඳහිරු ක්‍රීඩා සමාජය, විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදී.

03.19."කාර්යභාර නිලධාරී - ඌරගස්මංහන්දිය උපකාර්යාලය " යන මැයෙන් යුතුව ලේකම් තුමිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදී.

ගරු සභාපති ගාමිණි අමරවංශ මුණුගොඩ මැතිතුමා

ලේකම් තුමිය ලිපියක් ඉදිරිපත් කරලා තියෙනවා. කාර්යභාර නිලධාරී ගිය නිසා එම තනතුර පුරප්පාඩු වී ඇති බවට. ඒ නිසා බැංකු කටයුතු වලදී පවා ගැටළුකාරී තත්වයක් ඇති වෙලා තියෙන නිසා පුළුවන් ඉක්මනින් ඒසම්බන්ධව කටයුතු කරන ලෙස දන්වනවා.

03.20."ඌරගස්මංහන්දිය ගුණරත්න වීරකෝන් වෙළඳ සංකීර්ණයේ කඩකාමර තක්සේරු කිරීම " යන මැයෙන් යුතුව විෂය භාර ලිපිකරු, ආදායම් අංශය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදී.

03.21. ."කොන්ක්‍රීට් හෝ කුට්ටිගල්අතුරා පාරක් පිළිසකර කිරීම " යන මැයෙන් යුතුව වෙරළු අඩුවාව, මහඒදණ්ඩ, කරන්දෙණිය පදිංචි නාලක විශාන් සංජීව විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදී.

03.22 ."අප පාසලේ තූර්ය වාදක කණ්ඩායම සඳහා උපකරණ ලබා ගැනීමට " යන මැයෙන් යුතුව විදුහල්පති, ගා/ බන්දුල සේනාධීර ම.වි. විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදී.

ගරු සභාපති ගාමිණි අමරවංශ මුණුගොඩ මැතිතුමා

අපි මේක ගරු ආණ්ඩුකාර තුමාට යවමු. එතුමා අනුමත කරනවා නම් මම කැමතියි.

03.23."සෙල්ලම් මිදුලට උපකරණ ලබා ගැනීමසදහා " යන මැයෙන් යුතුව ප්‍රභාෂ්වර පෙරපාසල ,ජයබිම, කරන්දෙණිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදී.

03.24."පිරිත් පිංකම සදහා ආධාර මුදලක් ලබා ගැනීමට " යන මැයෙන් යුතුව එක්සත් සුභසාධක සංගමය , ජයබිම, ගලගොඩඅත්ත විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා

නිදහස් දිනය නිමිත්තෙන්අපි පිරිත් පිංකමක් කරනවා . සභාවෙන් සවුන්ඩ්ස් වලට අනුග්‍රහය ලබා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා. විවෘත ආරාධනයක් කරනවා 03 වෙනිදා පිරිත් අහන්න එන්න කියලා.

03.25."සැත්කමක් සදහා ආධාර මුදල් ලබා ගැනීමට " යන මැයෙන් යුතුව බෙලිගස්වෙල්ල, ඌරගස්මංහන්දිය පදිංචි ජයන්ත ඉද්දමල්දෙණිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදී.

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා

නීත්‍යානුකුල තත්වයක් තියෙද කියලා බලලා කරන්න පුළුවන් දෙයක් කරන්න.

03.26 ." 2023 වර්ෂය සදහා ඖෂධ ලබා ගැනීම සදහා " යන මැයෙන් යුතුව ආයුර්වේද වෛද්‍ය නිලධාරී විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදී.

## 04.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න

- නොමැත-

## 05. යථා පරිදි කල් දී ඇති යෝජනා

## 05.යථා පරිදි කල් දී ඇති යෝජනා -

5.1.1.ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

5.1.1.1.මහඡ්දණ්ඩ හා ඌරගස්මංහන්දිය නගර 02 තුළ පෞද්ගලික දැන්වීම් ප්‍රදර්ශනය සඳහා ඩිජිටල් නාම පුවරු 02 ක් සකස් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා

අපි කලිනුත් මේ වගේ යෝජනාවක් දැම්මා නමුත් ක්‍රියාතමක කර ගන්න බැරිවුණා.පලවෙනි අදියර යටතේ නගර 02 කට කියලා දැම්මා. මහඡ්දණ්ඩ , ඌරගස්මංහන්දිය හා කුරුඳුගහ හැතැක්ම යන නගර 03 ම කරන්න පුළුවන්නම් හොඳයි.අපි ඉදිරයේදී කුරුඳුගහටත් ඩිජිටල් නාම පුවරුවක් සැකසිමට කටයුතු කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.කේ.ජීවන්ති වීරසිංහ මැතිණිය

ඒක හොඳ යෝජනාවක්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා

කුරුඳුගහ නගරයටත් අවශ්‍යයි.

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා

මම එහෙනම් යෝජනාව පහත පරිදි සංශෝධනය කරනවා. මහජ්දණ්ඩ, කුරුඳුගහ හැතැක්ම, ඌරගස්මංහන්දිය යන නගර 03 සඳහා පෞද්ගලික දැන්වීම් ප්‍රසර්ශනය කිරීම සඳහා ඩිජිටල් නාම පුවරු 03 ක් සවි කිරීම සුදුසු බවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා

එම සංශෝධිත යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මහජ්දණ්ඩ, ඌරගස්මංහන්දිය කුරුඳුගහ හැතැක්ම යන නගර 03 තුළ පෞද්ගලික දැන්වීම් ප්‍රදර්ශනය සඳහා ඩිජිටල් නාම පුවරු 03ක් සකස් කිරීම සුදුසු බවට ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින්කරන ලද සංශෝධිත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභාසම්මත විය.

5.1.2.ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා.

5.1.2.1පෙහෙඹියකන්ද පිට්ටනිය අසල සිට කැකිරිය මාර්ගය දක්වා ඇති කොන්ක්‍රිට් මාර්ගයේ කැඩී ඇති ස්ථාන ගල්,වැලි,සිමෙන්ති ඇතුළු ද්‍රව්‍ය ලබාදී අළුත්වැඩියා කිරීම සුදුසු බවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඕ.කේ. ධම්මික සුසන්ත මැතිතුමා
මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා
මේ පාරවල් ගොඩක් කැඩිලා තියෙන්නේ. ඒ නිසා අළුත්වැඩියා කළයුතුයි.

ඒ අනුව පෙහෙඹියකන්ද පිට්ටනිය අසල සිට කැකිරිය මාර්ගය දක්වා ඇති කොන්ක්‍රිට් මාර්ගයේ කැඩී ඇති ස්ථාන ගල්,වැලි,සිමෙන්ති ඇතුළු ද්‍රව්‍ය ලබාදී අළුත්වැඩියා කිරීම සුදුසු බවට ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඕ.කේ. ධම්මික සුසන්ත මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභාසම්මත විය.

5.1.2.2.කරන්දෙණිය ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ සභාවේ අනුග්‍රහයෙන් නව පෙරපාසල් 03ක් ස්ථාපිත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.කේ.ජීවන්ති වීරසිංහ මැතිණිය විසින් ස්ථිර කරනලදි.

ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා
පෙරපාසල් අපේ දැනට තියෙන්නේ 02 ක් පමණයි.ඒ මහජ්දණ්ඩ ප්‍රධාන කාර්යාලීය පෙරපාසල සහ නුගේ තිබ්බකන්ද පෙරපාසල. නිසා සුදුසු ස්ථානයක් බලලා නව පෙර පාසලක් විවෘත කරන්න තමයි මේ යෝජනාව දැම්මේ.

ඒ අනුව කරන්දෙණිය ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ සභාවේ අනුග්‍රහයෙන් නව පෙරපාසල් 03ක් ස්ථාපිත කිරීම සුදුසු යැයි_ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.කේ.ජීවන්ති වීරසිංහ මැතිණිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභාසම්මතවිය.

5.1.2.3.දියපිටගල්ලන අටකොහොට මාර්ගයේ අජිත් මහතාගේ නිවස අසල කැඩී ඇති බෝක්කුව අළුත්වැඩියා කිරීම සුදුසු යැයි යෝජනා කරමි.
මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.කේ.ජීවන්ති වීරසිංහ මැතිණිය විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා</u>
මේ බෝක්කුව කැඩිලා තියෙන්නේ.මේ බෝක්කුව කඩිනමින් අළුත්වැඩියා කළ යුතුයි.

ඒ අනුව දියපිටගල්ලන අටකොහොට මාර්ගයේ අජිත් මහතාගේ නිවස අසල කැඩී ඇති බෝක්කුව අළුත්වැඩියා කිරීම සුදුසු_බවටගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින්_ගෙනඑන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.කේ.ජීවන්ති වීරසිංහ මැතිණිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභාසම්මතවිය.

5.1.2.4.කළුවලගොඩ හෝදාපාළුව අජිත් මහතාගේ නිවස අසල සිට ඇති අතුරු පාරේ සේදී යන කොටස කොන්ක්‍රීට් කිරීම සඳහා ගල් වැලි සිමෙන්ති අනෙකුත් ද්‍රව්‍ය සහා අරමුදලින් ලබාදීම සුදුසු බවට යෝජනා කරමි.
ඒ යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.කේ.ජීවන්ති වීරසිංහ මැතිණිය විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා</u>
මේ පාර අබලන් වෙලා තියෙන්නේ. කොන්ත්‍රාත්කරුවන්ඉදිරිපත් නොවෙන නිසා සභා අරමුදලින් අමුද්‍රව්‍ය ලබා ගැනීමට තමයි මේ යෝජනාව දැම්මේ.
සභාවෙන් අවශ්‍ය ද්‍රව්‍ය ලැබෙනවා නම් ගම් වාසීන් එකතු වෙලා මේ මාර්ගය සකස් කරන්න තමයි බලාපොරොත්තු වෙන්නේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශ්‍රියාණි පුංචිහේවා මැතිණිය</u>
මේ පාර ගොඩක්ම අබලන් වෙලා තියෙන්නේ. මීටර 300 ක් 400 ක් පමණ අබලන් වෙලා. උප සභාපති තුමණි කොටසක් නෙවෙයි පුළුවන්නම් මුළු පාරම හදන්න පුළුවන් නම් ගොඩක් හොඳයි.

ඒ අනුව කළුවලගොඩ හෝදාපාළුව අජිත් මහතාගේ නිවස අසල සිට ඇති අතුරු පාරේ සේදී යන කොටස කොන්ක්‍රීට් කිරීම සඳහා ගල් වැලි සිමෙන්ති අනෙකුත් ද්‍රව්‍ය සහා අරමුදලින් ලබාදීම සුදුසු බවට ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ගෙනඑන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.කේ.ජීවන්ති වීරසිංහ මැතිණිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභාසම්මතවිය.

5.1.3.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලහිරු සඳරුවන් සුරවීර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

5.1.3.1.කිරිමැටියාව සෝමසිරි මහතාගේ වෙළඳ සැල අසල සිට වීරජනපදය පෙර පාසල දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීමට අවශ්‍ය ගල්,වැලි ,සිමෙන්ති ඇතුළු අමුද්‍රව්‍ය සභා අරමුදලින් ලබාදීම සුදුසු බවට යෝජනා කරමි.
එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එච්.ශ්‍යාමා නිශාන්ති විමලවීර මැතිණිය විසින් ස්ථිර කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ලහිරු සඳරුවන් සුරවීර මැතිතුමා

මේ මාර්ගය සෑදිය යුතුම මාර්ගයක්.ගමේ අය තම ශ්‍රම දායකත්වයෙන් මේ මාර්ගය හදා ගනීවි. සභා අරමුදලින් ද්‍රව්‍ය ලබා ගැනීමට බලාපොරොත්තුවෙන් තමයි මේ යෝජනාව දැම්මේ.

ඒ අනුව කිරිමැටියාව සෝමසිරි මහතාගේ වෙළඳ සැල අසල සිට වීරජනපදය පෙර පාසල දක්වා මාර්ගය කොන්ක්‍රිට් කිරිමට අවශ්‍ය ගල්,වැලි ,සිමෙන්ති ඇතුළු අමුද්‍රව්‍ය සභා අරමුදලින් ලබාදීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ලහිරු සඳරුවන් සුරවීර මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි බී.එච්.ශ්‍යාමා නිශාන්ති විමලවීර මැතිණිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභාසම්මතවිය.

5.1.3.2.කිරිමැටියාව ශ්‍රී මහින්දාරාමය,ඌරගස්මංහන්දිය සිරි සීලරතනාරාමය, ගල්පොත්තාවෙල ශ්‍රී සුදර්ශණාරාමය යන විහාරස්ථාන තුනෙහි පවතින දහම් පාසල් සඳහා පොත් රඳවන කබඩ් 01 බැගින් ලබාදීම සුදුසු යැයි යෝජනා කරමි.
ඒ යෝජනාව එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි පී.එච්.සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ලහිරු සඳරුවන් සුරවීර මැතිතුමා

මේ දහම් පාසල් තුනේම ළමුන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. පොත් රඳවන්න තැනක් නෑ. අපි කබඩ් ලබා දෙනවානම් හොඳයි.

ඒ අනුව කිරිමැටියාව ශ්‍රී මහින්දාරාමය,ඌරගස්මංහන්දිය සිරි සීලරතනාරාමය, ගල්පොත්තාවෙල ශ්‍රී සුදර්ශණාරාමය යන විහාරස්ථාන තුනෙහි පවතින දහම් පාසල් සඳහා පොත් රඳවන කබඩ් 01 බැගින් ලබාදීම සුදුසු යැයි ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ලහිරු සඳරුවන් සුරවීර මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි පී.එච්.සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභාසම්මතවිය.

5.1.1.3.ඌරගස්මංහන්දිය උතුර මැතිවරණ කොට්ඨාශය තුළ 2023.01.12 හා 2023.01.13 දින ශ්‍රමදාන වැඩසටහනක් ප්‍රදේශවාසීන් විසින් සූදානම් කර ඇති අතර ඒ සඳහා සභාව සතු යන්ත්‍ර සූත්‍ර හා මානව සම්පත් ලබාදීම සුදුසු යැයි යෝජනා කරමි.
එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි බී.එච්.ශ්‍යාමා නිශාන්ති විමලවීර මැතිණිය විසින් ස්ථිර කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ලහිරු සඳරුවන් සුරවීර මැතිතුමා

ඌරගස්මංහන්දිය උතුර මැතිවරණ කොට්ඨාශය තුළ 2023.01.12 හා 2023.01.13 දින ශ්‍රමදාන වැඩසටහනක් පවත්වන්න කටයුතු යොදලා තියෙනවා.ඒ සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර ටිකත් එක්කම වැඩ කිෂෙත්‍ර කම්කරුවො කිහිප දෙනෙකුත් අපි බලාපෙරොත්තු වෙනවා.ඒ සඳහා සභාවේ සහයෝගය ලබාදෙන්න කියලා මම ඉල්ලීමක්කරනවා.

ඒ අනුව ඌරගස්මංහන්දිය උතුර මැතිවරණ කොට්ඨාශය තුළ 2023.01.12 හා 2023.01.13 දින ශ්‍රමදාන වැඩසටහනක් ප්‍රදේශවාසීන් විසින් සූදානම් කර ඇති අතර ඒ සඳහා සභාව සතු යන්ත්‍ර සූත්‍ර හා මානව සම්පත් ලබාදීම සුදුසු යැයි_ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ලහිරු සඳරුවන් සුරවීර මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි බී.එච්.ශ්‍යාමා නිශාන්ති විමලවීර මැතිණිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභාසම්මතවිය.

5.1.3.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩී.බන්දුසිරි මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

5.1.3.1.කීනගහතොට පාර මීට වසර කිහිපයකට පෙර තාර දමා සකස් කරන ලද පාරකි.නමුත් දැන් එය ඉතා අබලන් තත්වයේ පසුවන හෙයින් එය අළුත්වැඩියා කිරීම සුදුසු බවට යෝජනා කරමි.

ඒයෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එච්.සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩී.බන්දුසිරි මැතිතුමා
කීනගහතොට පාර මීට අවුරුදු කිහිපයකට පෙර තාර දමා හදපු පාරක්. නමුතු දැන් අබලන් වෙලා. ඒනිසා මේ පාර අළුත්වැඩියා කරනවානම් හොඳයි.

ඒ අනුව කීනගහතොට පාර මීට වසර කිහිපයකට පෙර තාර දමා සකස් කරන ලද පාරකි.නමුත් දැන් එය ඉතා අබලන් තත්වයේ පසුවන හෙයින් එය අළුත්වැඩියා කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩී.බන්දුසිරි මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එච්.සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.1.3.2.බොරකන්ද ගීගනගේ රත්නසිරි මහතාගේ නිවසට යන පාරට නිවාස 07ක් ඇතුලත් වේ.වර්ෂාවට සේදී යන පාර මහජනයාගේ ගමන් බිමන් වලට ඉතා දුෂ්කර තත්වයකි. එම නිසා මෙම පාර අළුත්වැඩියා කිරීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී බී.එච්.ශ්‍යාමා නිශාන්ති විමලවීර මැතිණිය විසින් ස්ථිර කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩී.බන්දුසිරි මැතිතුමා
මේ පාර වහිනකොට හේදිලා ගිහිල්ලා. මිනිසුන්ට ගමන් කරන්න අමාරුයි. මේ පාර අළුත්වැඩියා කරනවා නම් හොඳයි.

ඒ අනුව බොරකන්ද ගීගනගේ රත්නසිරි මහතාගේ නිවසට යන පාරට නිවාස 07ක් ඇතුලත් වේ.වර්ෂාවට සේදී යන පාර මහජනයාගේ ගමන් බිමන් වලට ඉතා දුෂ්කර තත්වයකි. එම නිසා මෙම පාර අළුත්වැඩියා කිරීම සුදුසු බවට_ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩී.බන්දුසිරි මැතිතුමා විසින් ගෙනඑන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී බී.එච්.ශ්‍යාමා නිශාන්ති විමලවීර මැතිණිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභාසම්මත විය.

## 05.02. හදිසි යෝජනා

05.2.1. ගරුසභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් කරන ලද හදිසි යෝජනා

05.2.1.1ගරු ආණ්ඩුකාරතුමා විසින් ඌරගස්මංහන්දියේ නව ගොඩනැගිල්ලේ කඩ කාමර අංක 01 ට එක්වන් මුදල් ගෙවීම සදහා මාස 06ක සහන කාලයක් ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇත. නමුත් එම අදාල පුද්ගලයා මුදල් ගෙවූ පසු යතුර භාර ගැනීමට එකඟනොවූ හෙයින් මේ සදහා සුදුසු සභා තීරණයක් ගන්නා ලෙස මම යෝජනා කරමි.
මෙම හදිසි යෝජනාව ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ස්ථිරකරනලදි.

ගරුසභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා

අපි කලින් ඉවත් කරපු කඩකාමර 04 අයට 50% එක්වන් මුදලක් අරගෙන කඩ දෙන්න තීරණය කළා. ටෙන්ඩර් කරපු කඩවලට 100% මුදල් අරන් තමයි තීන්දුකරේ. එක් කඩහිමියකු තමයි ගරු ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලීමක් කරලා තියෙන්නේ. එතුමා අපිට ලිපියක් එවලා තියෙනවා මාස 06

ක සහන කාලයක් ලබාදෙන ලෙස. මම එතුමාට එකඟවුනා මාස 06 ක් කල් දෙන්න. ඒත් යතුරු භාරදීමට නෙවෙයි. යතුරු භාරදීමට හැකියාවක් නෑ. ඊට පසුව ඉන්න ටෙන්ඩර්කරුත් මට කථා කරලා කිව්වා ටෙන්ඩර් පටිපාටියට යන්න නැත්නම් නඩු දානවා කියලා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.සරත් ගුණරත්න මැතිතුමා</u>

ආණ්ඩුකාරතුමා ටෙන්ඩර් තොරතුරු නොදැනයි ගෙවීමට කල් දෙන්නඇත්තේ. නමුත් මේකෙන් සභාව අප්‍රසාදයට පත්වෙනවා. අපි මුල ඉඳන්ම යෝජනා කරා ටෙන්ඩර් එකක් දැම්මම ඒ මුදල කඩකාමරය භාරදෙන්න ඉස්සෙල්ලා ගෙවිය යුතුයි කියලා . ගෙවීමේ ක්‍රමයට දුන්නම සීට්ටුවක් වගෙයි. එහෙම දෙනවානම් සාමාන්‍ය මිනිස්සු ඉන්නවා මේ කඩ ඉල්ලන්න.එහෙනම් ඊට වඩා ඉල්ලුමක් එනවා මේ කඩ වලට. ටෙන්ඩර් ගත්තම මුළු මුදලම ගෙවන්න ඕන. අපි මේ ටෙන්ඩරය කළේ අවංකභාවයෙන්. නමුත් චෝදනාවක් ආවා හැටපන් ලක්ෂයයි, හැටපන් ලක්ෂ හයසීයටයි. අපි ඒ චෝදනා කළ අයට පැහැදිලිකළා අසාධාරණයක් නොවුන බවට. එතනදීත් අපි මේ පුද්ගලයට සහය දුන්නා. තවත් අපි අවස්ථාව දුන්නම අපි එයාට විශේෂයක් කරා වෙනවා.මෙහෙම ගෙවන් යන්න දෙනවා නම් අහිංසක මිනිසුන්ටත් කඩගන්න හැකියාවක් තියෙනවා. අපි සභාවක් හැටියට මේ ටෙන්ඩර් ක්‍රමයට කටයුතු කරමු. කව්රුහරි නඩුවක් දැම්මොත් අපේ සභාවටත් ප්‍රශ්ණයක්. අපි ටෙන්ඩර් පටිපාටිය ඒ විදියටම ක්‍රියාත්මක කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.පී.සුහසිංහ මැතිතුමා</u>

ආණුඩුකාරතුමා මෙහෙම අනුමැතියක් දෙන්න හේතුව මොකක්ද සභාපතිතුමා.

<u>ගරුසභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

මොහු අපහසුතා ගැන ඉදිරිපත් කරලා තිබුණා. ගරු ආණ්ඩුකාරතුමා මට දැනුම් දීලා තියෙන්නේ මාස 06 ක් කල් දෙන්න කියලා. මේකට ආණ්ඩුකාරතුමා දක්වන්න ඇත්තේ සාධාරණ ඉල්ලීමක්. ඒත් සභාවේ තීන්දුව මතයි මම රැදිලා ඉන්නේ. සභාවෙන් ගන්න තීරණයකට මම එකඟවෙනවා.

<u>ප්‍රාදේශීය සභා මන්ත්‍රී රම්‍ය ශ්‍රී මැතිතුමා.</u>

යම් පුද්ගලයෙක් ටෙන්ඩරයක් දාන්නේ ටෙන්ඩර් පටිපාටියකට අනුව. ප්‍රාදේශීය සභාවක් කියන්නේ සභාපති සහ මන්ත්‍රී මණ්ඩලය. අපි සභාවේ සභිකයෝ හැටියට පළවෙනි ටෙන්ඩර්කරු එම නීති මගඇරලා නම් දෙවන ටෙන්ඩර්කරුට ලබා දිය යුතුයි. දෙවැනියා නඩු දැම්මොත් අපිටයි ප්‍රශ්ණෙ වෙන්නේ.

<u>ගරුසභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

මේක බරපතල ප්‍රශ්ණයක්. කලින් දීපු කඩවලත් එක්වන් මුදල් ගෙවපු නැති නිසා ඒක මටත් වඩා නිළධාරීන්ට ප්‍රශ්ණයක් වෙලා. මේක ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගයක් නිසා අධිහාර වෙන්නැහැ. නමුත් දෙවැනි ටෙන්ඩර්කරු නඩු දැම්මොත් තමයි අපි හැමෝටම ප්‍රශ්ණයක් වෙන්නේ. මගේ යුතුකම තමයි ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගය සභාවට දැනුම් දෙනඑක.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් කුමාර කරුණාතුංග මැතිතුමා.</u>

ඌරගහ තවත් කඩකාමර තියෙනවා මුදල් නොගෙවපු. මම ඉල්ලා සිටිනවා මේ පුද්ගලයාට මාස 06 ක් කල් දෙන්න කියලා.

<u>ගරුසභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

අපි ටෙන්ඩර් කරලා තක්සේරු කළ මුදලට දුන්නා. මෙතන තියෙන්නේ මොහු අන් අයට ගන්න නොදී වැඩි මුදලක් දාලා ඔහු අරගන සීට්ටු ක්‍රමයට ඉල්ලනවා. එහෙනම් සති 02 ක කාලයක් මුදල් ගෙවීමට

ලබාදෙමු. මේ සම්බන්ධව එහෙනම් ඡන්ද විමසීමක් කරමු. ආණ්ඩුකාරතුමාගේ ලිපිය පරිදි මොවුන්ට මාස 06 ක් කල් ලබා දීමට කැමති මන්ත්‍රීතුමන්ලා අත් ඔසවා ඡන්දය ප්‍රකාශ කරන්න.

එම යෝජනාව සම්බන්ධව ඡන්දය විමසීමේදී ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් ඡන්දය විමසන ලදුව අජිත් කුමාර කරුණාතුංග මැතිතුමා (ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී) පමණක් ගරු ආණ්ඩුකාර තුමාගේ ලිපිය පරිදි ඔවුන්ට මාස 06 ක් කල් දීම සඳහා පක්ෂව මනාපය පළ කරන ලදි.
අනතුරුව ගරු සභාපතිතුමා මොවුන්ට මාස 06 ක් කල් දීමට විපක්ෂව තම ඡන්දය ප්‍රකාශ කරන ලෙස දැනුම් දෙන ලදි. එහිදී, ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා (ගරු සභාපති),එස්.පී නිමල් බන්දු මැතිතුමා (ගරු උප සභාපති),එම්.එස්.කපිල කුමාර මැතිතුමා (ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී), ගාල්ලගේ ලහිරු සඳරුවන් සුරවීර මැතිතුමා (ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී), බී.එච්.ශ්‍යාමා නිශාන්ති විමලවීර මැතිනිය (ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී) පී.එච්. සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා (ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී), සමීර චතුරංග ආරියරත්න(ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී) ,ටී.එච් කමල් හේවගේ මැතිතුමා (ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී), රම්‍ය ශ්‍රී විජේතුංග මැතිතුමා (ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී),ඒ.ඒ.සරත් ගුණරත්න මැතිතුමා(ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී) , ඕ .කේ ධම්මික සුසන්ත මැතිතුමා (ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී) කළුවා දේව බන්දුසිරි (ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී) ,අම්පෙගමගේ හර්ෂනී දීපිකා (ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී) එන්.පි.සුභසිංහ මැතිතුමා (ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී) එම්.කියාස්.එම්.සිරාස් මැතිතුමා (ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී) චන්ද්‍රිකා කාන්ති වීරසිංහ මැතිනිය (ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී) ශ්‍රියාණි පුංචිහේවා මැතිනිය (ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී) යන මන්ත්‍රීවරු මෙම යෝජනාව සම්බන්ධව විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන ලදි. පී.එච්.චම්පික කුෂාන් ගුණසිංහ මැතිතුමා (ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී)එම අවස්ථාවේ සභා ගර්භයේ නොසිටි අතර ඩී.කේ.ජීවන්ති වීරසිංහ මැතිණිය (ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ) මෙම යෝජනාවට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ලබා දීමෙන් වැලකී සිටින ලදි.

ඒ අනුව වැඩි ඡන්ද 17 කින් ආණ්ඩුකාරතුමාගේ ලිපිය පරිදි මොවුන්ට මාස 06 ක් කල් ලබා දීමට විපක්ෂව ඡන්දය ප්‍රකාශ වූ බැවින් එම යෝජනාව ප්‍රතික්ෂේප විය.

5.2.1.1 මහ ගෙදරවත්ත, එගොඩවෙල, කරන්දෙණිය ලිපිනයේ පදිංචිව සිට මියගිය කේ .ඩබ්ලිව්. ලැම්බට් ද සොයිසා මහතාට හිමිව තිබූ මහජ්දණ්ඩ පොළ භූමියේ පිහිටි අංක 07 දරණ කඩකාමරය ඔහුගේ මියයාම හේතුවෙන් ඔහුගේ බිරිඳ සහ දරුවා වන ඩබ්ලිව්. ලසන්ත ද සොයිසා යන අයට අයත් වන නමුත් ඔවුනට බදු කුලී ගෙවීමේ ඇති අපහසුතාවය හේතුවෙන්, 225/3/1කොන්ගහවත්තපාර , අමරකීර්ති ගම, බොරකන්ද , කරන්දෙණිය ලිපිනයෙහි පදිංචි සදිනා නිශාන්ති ලක්මාලි සුමනදාස මියට රුපියල් 1900.00ක මාසික බදු කුලිය ගෙවාගෙන යන පරිදි රුපියල් 40,000.00 ක පැවරුම් ගාස්තු මුදල ගෙවා පැවරීම සුදුසු බවට යෝජනා කරමි.

එම හදිසි යෝජනාව ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>ගරුසභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

මහ ගෙදරවත්ත, එගොඩවෙල, කරන්දෙණිය ලිපිනයේ පදිංචිව සිටිය මියගිය කේ .ඩබ්ලිව්. ලැම්බට් ද සොයිසා මහතාට හිමිවෙලා තිබුණ මහජ්දණ්ඩ පොළ භූමියේ පිහිටි අංක 07 දරණ කඩකාමරය ඔහුගේ මියයාම නිසා ඔහුගේ බිරිඳ සහ දරුවා වන ඩබ්ලිව්. ලසන්ත ද සොයිසා ට තමයි දැන් අයිති. ඔවුන් 225/3/1කොන්ගහවත්තපාර , අමරකීර්ති ගම, බොරකන්ද , කරන්දෙණිය පදිංචි සදිනා නිශාන්ති ලක්මාලි සුමනදාස මියට පැවරීමට කැමැත්ත ප්‍රකාශ කරලා තියෙනවා. ඒ අනුව රුපියල් 1900.00ක මාසික බදු කුලිය ගෙවාගෙන යන පරිදි රුපියල් 40,000.00 ක පැවරුම් ගාස්තු මුදල ගෙවා පැවරීම සුදුසු බවට තමයි මේ යෝජනා කරලා තියෙන්නේ.

මහ ගෙදරවත්ත, එගොඩවෙල, කරන්දෙණිය ලිපිනයේ පදිංචිව සිට මියගිය කේ .ඩබ්ලිව්. ලැම්බට් ද සොයිසා මහතාට හිමිව තිබු මහජ්දණ්ඩ පොළ භූමියේ පිහිටි අංක 07 දරණ කඩකාමරය ඔහුගේ මියයාම නිසා 225/3/1කොන්ගහවත්තපාර , අමරකීර්ති ගම, බොරකන්ද , කරන්දෙණිය ලිපිනයෙහි පදිංචි සදිනා නිශාන්ති ලක්මාලි සුමනදාස මියට පැවරීම සුදුසු බවට ගරුසභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.2.1.2.කරන්දෙණිය ප්‍රාදේශිය සභාවේ නිලධාරීන්ගේ සහය සඳහා දිනකට රුපියල් 500ක දීමනාවක් ලබාදීමේ පදනම මත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පාඨමාලාව හදාරා ඇති රවිනි රසාංජලී ජයවීර මෙය මාස 06ක ප්‍රායෝගික පුහුණුව ලබාදීම සඳහා බඳවා ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

මෙම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ලහිරු සඳරුවන් සුරවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

අපේ නිලධාරීන්ගේ සහය සඳහා දිනකට රුපියල් 500ක දීමනාවක් ලබාදීමේ පදනම මත තමයි ඌරවත්ත, අම්බලන්ගොඩ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පාඨමාලාව හදාරලා තියෙන රවිනි රසාංජලී ජයවීර මෙනවිය මාස 06ක ප්‍රායෝගික පුහුණුව ලබාදීම සඳහා බඳවා ගැනීමට තමයි මේ යෝජනාව දාලා තියෙන්නේ. කලින් අපි සභාගත කරලා අනුමත කරපු කේ. තිසරු විනොත් ද සිල්වා මහතා ප්‍රායෝගික පරීක්ෂණය සඳහා නොපැමිණෙන නිසා ඒ වෙනුවට රවිනි රසාංජලී ජයවීර මෙනවිය බඳවා ගැනීම සුදුසු බවයි මට හිතෙන්නේ.

ඒ අනුව කරන්දෙණිය ප්‍රාදේශිය සභාවේ නිලධාරීන්ගේ සහය සඳහා දිනකට රුපියල් 500ක දීමනාවක් ලබාදීමේ පදනම මත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පාඨමාලාව හදාරා ඇති රවිනි රසාංජලී ජයවීර මෙය මාස 06ක ප්‍රායෝගික පුහුණුව ලබාදීම සඳහා බඳවා ගැනීම සුදුසු බවට ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ලහිරු සඳරුවන් සුරවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

5.2.1.3 ඌරගස්මංහන්දිය නගරයේ ඉදිකර අවසන් කර ඇති කඩකාමර 08 කින් සමන්විත නව දෙමහල් වෙළඳ සංකීර්ණයේ කඩකාමර සඳහා අය කළයුතු බදු මුදල් සම්බන්ධව තක්සේරුවක් ,තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලැබෙන තුරු සභාවේ ආදායම්පරීක්ෂකවරුන්ගෙන් තක්සේරුවක් ලබාගෙන ඒ අනුව මාසික කුලිය අයකිරීම සුදුසු බවට යෝජනා කරමි.

මෙම හදිසි යෝජනාව ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

ඌරගස්මංහන්දිය නගරයේ ඉදිකරලා අවසන් කරලා තියෙන කඩකාමර 08 කින් සමන්විත වුන නව දෙමහල් වෙළඳ සංකීර්ණයේ කඩකාමර සඳහා අය කළයුතු බදු මුදල් සම්බන්ධව තීරණයක් ගන්න අපි ඒ පිළිබඳ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කළා. ඒ තක්සේරුව ලැබෙනකන් සභාවේ ආදායම්පරීක්ෂකවරුන්ගෙන් තක්සේරුවක් ලබාගෙන ඒ අනුව මාසික කුලිය අයකිරීම සුදුසු බවටයි මේ යෝජනාව ඉදිරිපත් කරලා තියෙන්නේ.

ඌරගස්මංහන්දිය නගරයේ ඉදිකර අවසන් කර ඇති කඩකාමර 08 කින් සමන්විත නව දෙමහල් වෙළඳ සංකීර්ණයේ කඩකාමර සඳහා අය කළයුතු බදු මුදල් සම්බන්ධව තක්සේරුවක් ,තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලැබෙන තුරු සභාවේ ආදායම්පරීක්ෂකවරුන්ගෙන් තක්සේරුවක් ලබාගෙන ඒ අනුව මාසික කුලිය අයකිරීම සුදුසු බවට ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා

විසින්කරන ලද යෝජනාව ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

5.2.1.4.කරන්දෙණිය ප්‍රාදේශිය සභාවේ ප්‍රධාන කාර්යාලීය ආයුර්වේදය හා උප කාර්යාලීය ආයුර්වේදයේ ඖෂධ අවසන්ව ඇති බැවින් ආයුර්වේද වෛද්‍ය නිලධාරී විසින් එම ආයුර්වේද සඳහා රුපියල් 59630.00 ක් වටිනා ඖෂධ මිලට ගෙන ලබාදීම සුදුසු බවට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

අපේ ආයුර්වේදය හා උප කාර්යාලීය ආයුර්වේදයේ ඖෂධ අවසන්වෙලා තියෙන නිසා ඒ ආයුර්වේද සඳහා රුපියල් 592630.00ක් වටිනා ඖෂධ මිලට අරන් ලබාදෙන්න කියලා අපේ ආයුර්වේද වෛද්‍ය නිලධාරී විසින් කරන ලද ඉල්ලීම පරිදි අපි ඒ ඖෂධ මිලට අරගන ලබාදීමට කටයුතු කරමු.

කරන්දෙණිය ප්‍රාදේශිය සභාවේ ප්‍රධාන කාර්යාලීය ආයුර්වේදය හා උප කාර්යාලීය ආයුර්වේදයේ ඖෂධ අවසන්ව ඇති බැවින් එම ආයුර්වේද සඳහා රුපියල් 521,280.00ක් වටිනා ඖෂධ මිලට ගෙන ලබාදීම සුදුසු බවට ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

5.2.1.5. ඌරගස්මංහන්දිය උප කාර්යාලයේ කාර්ය භාර නිළධාරී වශයෙන් සේවය කළ නිමල් මලවිගේ මහතා 2023.01.05 දින සිට අම්බලන්ගොඩ නගර සභාවට ස්ථානමාරු ලබා යාම නිසා කාර්ය භාර නිළධාරී වශයෙන් වෙනත් නිළධාරියකු පත්කිරීමට අවශ්‍ය බැවින් ඒ සඳහා සංවර්ධන නිළධාරී ඉනෝකා සමරනායක මිය පත් කිරීම සුදුසු බවට ද , ඇයට කාර්යභාර නිළධාරී, ඌරගස්මංහන්දිය උප කාර්යාලය නමින් නිකුත්කරන චෙක්පත් මාරුකිරීමේ බලය පැවරීම සුදුසු බවට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

ඌරගස්මංහන්දිය උප කාර්යාලයේ කාර්ය භාර නිළධාරී වශයෙන් සේවය කරපු නිමල් මලවිගේ මහතා 2023.01.05 ඉඳන් අම්බලන්ගොඩ නගර සභාවට ස්ථානමාරු ගියා. ඒ නිසා කාර්ය භාර නිළධාරී වශයෙන් වෙනත් නිළධාරියෙක් පත්කිරීමට අවශ්‍යවෙලා තියෙනවා.ඒ සඳහා සංවර්ධන නිළධාරී ඉනෝකා සමරනායක මහත්මිය පත් කිරීම සුදුසු බවත් ඇයට කාර්යභාර නිළධාරී, ඌරගස්මංහන්දිය උප කාර්යාලය නමින් නිකුත්කරන චෙක්පත් මාරුකිරීමේ බලය පැවරීම සුදුසුයි කියලා මම හිතනවා.

ඒ අනුව ඌරගස්මංහන්දිය උප කාර්යාලයේ කාර්ය භාර නිළධාරී වශයෙන් සේවය කළ නිමල් මලවිගේ මහතා 2023.01.05 දින සිට අම්බලන්ගොඩ නගර සභාවට ස්ථානමාරු ලබා යාම නිසා කාර්ය භාර නිළධාරී වශයෙන් වෙනත් නිළධාරියකු පත්කිරීමට අවශ්‍ය බැවින් ඒ සඳහා සංවර්ධන නිළධාරී ඉනෝකා සමරනායක මිය පත් කිරීම සුදුසු බවට ද , ඇයට කාර්යභාර නිළධාරී, ඌරගස්මංහන්දිය උප කාර්යාලය නමින් නිකුත්කරන චෙක්පත් මාරුකිරීමේ බලය පැවරීම සුදුසු බවට ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් කරන ලද හදිසි යෝජනාව ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

5.2.1.6. SPZA 5217 ෆෝටෝන් යන්ත්‍රයේ අළුත්වැඩියාව සඳහා ලැබී ඇති මිල ගණන් යාන්ත්‍රික ඉංජිනේරු වෙත ඉදිරිපත් කර අළුත් වැඩියාව සඳහා අවශ්‍ය නිර්දේශ ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

| | JSP | SU Lanka | Avon |
|---|---|---|---|
| SPZA 5217 ෆෝටෝන් යන්ත්‍රයේ අළුත්වැඩියාව සඳහා ලැබී ඇති මිල ගණන් | 288,200.00 | 431,560.00 | 333,814.60 |

මෙම යෝජනාව ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව SPZA 5217 ෆෝටෝන් යන්ත්‍රයේ අළුත්වැඩියාව සඳහා ලැබී ඇති මිල ගණන් යාන්ත්‍රික ඉංජිනේරු වෙත ඉදිරිපත් කර අළුත් වැඩියාව සඳහා අවශ්‍ය නිර්දේශ ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය

5.2.1.10. කරන්දෙණිය ප්‍රාදේශීය සභාව මගින් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව වෙනත් ආයතන සඳහා පහත පරිදි ඉන්ධන ලබාදී ඇති බැවින් ඒ සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට යෝජනා කරමි.

| ලබා දී ඇති ආයතනය හා දිනය | වාහන අංකය | කාරණය | ප්‍රමාණය | වටිනාකම (රු) |
|---|---|---|---|---|
| සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය 2022.12.01 | SPQL 7145 | ජල භීතිකා වැඩසටහන | පෙට්‍රල් ලීටර්06 | 2580.00 |
| සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය 2022.12.09 | SPQL 7145 | ජල භීතිකා වැඩසටහන | පෙට්‍රල් ලීටර් 07 | 3010.00 |
| සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය 2022.12.28 | SPQL 7145 | ජල භීතිකා වැඩසටහන | පෙට්‍රල් ලීටර් 07 | 3010.00 |

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

හැම මාසෙටම අදාලව පිට ආයතන වලට ලබා දීපු ඉන්ධන සඳහා අනුමැතිය ලබා ගැනීමට තමයි මේ යෝජනාව ඉදිරිපත් කළේ.

ඒ අනුව කරන්දෙණිය ප්‍රාදේශීය සභාව මගින් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව වෙනත් ආයතන සඳහා පහත පරිදි ඉන්ධන ලබා දී ඇති බැවින් ඒ සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති

ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය..

5.2.1.11.කරන්දෙණිය ප්‍රාදේශිය සභාවේ පෙරපාසල් දෙකෙහි දරුවන් 60ක් සඳහා 01ක් රුපියල් 2000.00 බැගින් නිලඇඳුම් 02 බැගින් ලබාදීම සුදුසු බවත් ඒ සඳහා සභා අරමුදලින් රුපියල් 240,000.00ක් වැය කිරීම සුදුසු බවත් මම යෝජනා කරනවා.

මෙම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ශ්‍යාමා නිශාන්ති විමලවීර මැතිනිය විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

කරන්දෙණිය ප්‍රාදේශිය සභාවේ පෙරපාසල් දෙකෙහි දරුවන් 60ක් සඳහා තමයි එක නිල ඇඳුමක් රුපියල් 2000.00 බැගින් නිලඇඳුම් 02 බැගින් ලබාදෙන්නත් ඒ සඳහා සභා අරමුදලින් රුපියල් 240,000.00ක් වැය කරන ලෙස ඉල්ලීමක් කරලා තමයි ප්‍රජා සංවර්ධන නිලධාරී මේ හදිසි යෝජනාව දාලා තියෙන්නේ. අපි මේ සඳහා ඉඩදෙමු.

ඒ අනුව කරන්දෙණිය ප්‍රාදේශිය සභාවේ පෙරපාසල් දෙකෙහි දරුවන් 60ක් සඳහා 01ක් රුපියල් 2000.00 බැගින් නිලඇඳුම් 02 බැගින් ලබාදීම සුදුසු බවත් ඒ සඳහා සභා අරමුදලින් රුපියල් 240,000.00ක් වැය කිරීම සුදුසු බවට ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් කරන ලද හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ශ්‍යාමා නිශාන්ති විමලවීර මැතිනිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## <u>5.2.2.ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ගෙන එන ලද හදිසි යෝජනාව</u>

5.2.2.1. 39 F ඌරගස්මංහන්දිය නැගෙනහිර වසමේ පිහිටි ප්‍රජා ශාලාවට විදුලිය ලබා ගැනීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ශ්‍යාමා නිශාන්ති විමලවීර මැතිනිය විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා</u>

අපි මේ ප්‍රජා ශාලාවට විදුලිය ලබා දීමට කටයුතු කරමු.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

අපි ගිය සභාවේ තීන්දුවක් ගත්තා ගෙවාගන යන පදනම මත දෙන්න කියලා.

ඒ අනුව 39 F ඌරගස්මංහන්දිය නැගෙනහිර වසමේ පිහිටි ප්‍රජා ශාලාවට විදුලිය ලබා ගැනීම සඳහා ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමා විසින් ගෙන එන ලද හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ශ්‍යාමා නිශාන්ති විමලවීර මැතිනිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 5.2.3.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් කරන ලද හදිසි යෝජනාව

5.2.3.1. 2023 වර්ෂයේ නිදහස් දිනය නිමිති කරගෙන ජයබිම ප්‍රජා ශාලාවේ පවත්වනු ලබන පිරිත් පිංකම සඳහා ගනු ලබන ශබ්ද වාහිනී යන්ත්‍රය සඳහා යන මුදල සභා අරමුදලින් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

මෙම හදිසි යෝජනාව ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමාවිසින් ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා</u>

නිදහස් දිනය නිමිත්තෙන් අපි පිරිත් පිංකමක් කරනවා. සවුන්ඩ්ස් වලට අනුග්‍රහය ලබා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා. විවෘත ආරාධනයක් කරනවා 03 වෙනිදා එන්න කියලා.

ඒ අනුව 2023 වර්ෂයේ නිදහස් දිනය නිමිති කරගෙන ජයබිම ප්‍රජා ශාලාවේ පවත්වනු ලබන පිරිත් පිංකම සඳහා ගනු ලබන ශබ්ද වාහිනී යන්ත්‍රය සඳහා යන මුදල සභා අරමුදලින් ලබා දීම සුදුසු බවට ගරු එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති එස්.පී.නිමල් බන්දු මැතිතුමාවිසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 5.2.3.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සමීර චතුරංග ආරියරත්න මැතිතුමා විසින් කරන ලද හදිසි යෝජනා

5.2.3.1.පසුගිය සතියේ සභා අරමුදල් රුපියල් 2,000,000 ක් වැය කර කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා අභ්‍යාස පොත් ලබාදීම සිදු කරනු ලැබුවද එම ප්‍රමාණය අප බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් වල දරුවන් සඳහා ප්‍රමාණවත් නොවුනි. එබැවින් පොත් කට්ටල නොලැබුනු අඩු ආදායම්ලාභී පවුල් වල දරුවන් සඳහා ද මෙම අවස්ථාව ලබා දිය යුතු බැවින් ඒ සඳහා තවත් රුපියල් 3,000,000.00 ක් සභා අරමුදලින් වෙන් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

මෙම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගාල්ලගේ ලහිරු සඳරුවන් සුරවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමීර චතුරංග ආරියරත්න මැතිතුමා</u>

මේ වැඩසටහනේදී අඩු ආදායම්ලාභී සියළු දෙනාට පොත් ලබා දීමට පොත් ප්‍රමාණවත් වුණේ නැති නිසා ඇත්තටම අපි මන්ත්‍රීවරුන් විදියට ගොඩක් අපහසුතාවයට පත්වුණා. ඒ නිසයි තවත් අඩු ආදායම්ලාභීන් 2000 කට පොත් ලබා දෙමු කියලා මම හදිසි යෝජනාවක් දැම්මේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශ්‍රියාණි පුංචිහේවා මැතිණිය</u>

අපෙන් පොත් බෙදද්දී ගොඩක් අඩු ආදායම් ලාභීන් මඟඇරිලා තිබුණා. ඒක නිසා ඒ මඟඇරුණු පවුල්වල එක ළමයෙක් නියොජනය වන පරිදි හරි දෙන්න. 1 වසරේ ඉඳන් 13 වසර දක්වා ළමයි ඉන්න නිසා තෝරාගත්ත පොත් කට්ටලයක් කුඩා පන්ති වල ළමුන් ද ඇතුළත් වන විදියට සියළු පරාසයේ ළමුන් නියෝජනය වන පරිදි පොත් කට්ටලය තෝරගමු.

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

අපි මුලින් ලක්ෂ 20 ක් අනුමත කළා. ළමුන් 1000 කට පොත් දෙන්න. ඒකෙන් ලක්ෂ දහසයාමාරක් ගියා. පස්සේ ඉතිරි ඒ මුදලයෙත් පොත් ගෙනාවා. දැන් ළමයි 2000 ක් නිසා ලක්ෂ 40 ක් වත් යයි.

ඒ අනුව පසුගිය සතියේ සභා අරමුදල් රුපියල් 2,000,000 ක් වැය කර කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා අභ්‍යාස පොත් ලබාදීම සිදු කරනු ලැබුවද එම ප්‍රමාණය අප බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් වල දරුවන් සඳහා ප්‍රමාණවත් නොවුනි. එබැවින් පොත් කට්ටල නොලැබුනු අඩු ආදායම්ලාභී පවුල් වල දරුවන් සඳහා ද මෙම අවස්ථාව ලබා දිය යුතු බැවින් ඒ සඳහා තවත් රුපියල් 3,000,000.00 ක් සභා අරමුදලින් වෙන් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමීර චතුරංග ආරියරත්න මැතිතුමා විසින් කරන ලද හදිසි යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගාල්ලගේ ලහිරු සඳරුවන් සුරවීර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය.

5.2.4.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ .ජී.හර්ෂණී දීපිකා මැතිනිය විසින් කරන ලද හදිසි යෝජනාව

5.2.4.1.අනුරුද්ධගම බොහෝ පාරවල් ඉතා අබලන්වී ඇති බැවින් සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදා සකස් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

එම හදිසි යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රම්‍ය ශ්‍රී විජේතුංග මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ .ජී.හර්ෂණී දීපිකා මැතිනිය</u>

අනුරුද්ධගම ගොඩක් පාරවල් ඉතා අබලන්වෙලා තියෙන්නේ. ඒ නිසා සභාවේ ජේ.සී.බී යන්ත්‍රය දාලා සකස් කරන්න පුළුවන් නම් ගොඩක් හොඳයි.

ඒ අනුව අනුරුද්ධගම බොහෝ පාරවල් ඉතා අබලන්වී ඇති බැවින් සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදා සකස් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ .ජී.හර්ෂණී දීපිකා මැතිනිය විසින් කරන ලද හදිසි යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී රම්‍ය ශ්‍රී විජේතුංග මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතකව සභාසම්මත විය.

## <u>7.වෙනත් කරුණු</u>

07.01.ඇස්තමේන්තු අනුමැතියට ඉදිරිපත් කිරීම

01.උතුරු මාගල පහළ දූව මාර්ගයේ පැතිබැම්ම සකස් කිරීම

ඇස්තමේන්තු මුදල - රුපියල් 126,3000.00

02.විපුලසාර පාසල් මාවත තාර දමා සංවර්ධනය කිරීම

ඇස්තමේන්තු මුදල - රුපියල් 1,982,000.00

03. ගලගොඩඅත්ත මාර්ගයේ කුමාර මහතාගේ නිවස අසල ඇති බෝක්කුව අළුත්වැඩියාව සංශෝධිත ඇස්තමේන්තුව

ඇස්තමේන්තු මුදල - රුපියල් 430,000.00

04.බෙලිගස්වේල්ල ප්‍රජා ශාලාව අළුත්වැඩියා කිරීම.

ඇස්තමේන්තු මුදල - රුපියල් 1,300,000.00

05. මීගස්පිටිය හිරිකුඹුර මාර්ගය තාර දමා සකස් කිරීම

ඇස්තමේන්තුගත මුදල - රුපියල් 4,900,000.00

06. 4 කණුව , කුරුඳුවත්ත,මහජ්දණ්ඩ මාර්ගය ඉන්ටලොක් ඇතිරීම

ඇස්මේන්තුගත මුදල - රුපියල් 450,000.00

07.මඩකුඹුර පාසල ඉදිරිපිට අතුරු මාර්ගය සංවර්ධනය සංශෝධිත ඇස්තමේන්තුව

ඇස්මේන්තුගත මුදල - රුපියල් 200,000.00

ඉහත සඳහන් ඇස්තමේන්තු සහා සම්මත කිරීම සුදුසු බවත් එම ඇස්තමේන්තු මුදල යටතේම එම කර්මාන්ත සිදු කිරීම සුදුසු බවත් ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එස්.කපිල කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

07.02.2023-2026 වසර සඳහා සකසන ලද සිව් අවුරුදු සැලැස්ම සභා ගත කරන ලද අතර එය අනුමතකරන ලෙසට ගරු සභාපති ගාමිණී අමරවංශ මැතිතුමා විසින් සිදු කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ලහිරු සඳරුන් සුරවීර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය.

07.03තිරසර සංවර්ධන සැලැස්ම සභා ගත කරන අතර එය අනුමතකරන ලෙසට ගරු සභාපති ගාමිණී අමරවංශ මැතිතුමා විසින් සිදු කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා

07.04. වෑන් රථගාල පවතින ස්ථානය වෙනස් කිරීම සඳහා "යන මැයෙන් යුතුව සභාපති, රියදුරු සංගමය , ඌරගස්මංහන්දිය විසින් ඉදිරිපත් කරන ලදුව සභා ගත කරන ලද ලිපිය පිළිබඳ කරුණු සාකච්ඡා කිරීම සඳහා මේ අවස්ථාව ලබා ගමු.

ගරු උප සභාපති එස්.පි.නිමල් බන්දු මැතිතුමා

මෙම ස්ථානය මෙම පුද්ගලයන් විසින් තාවකාලිකවයි ඉල්ලන්නේ. වටරවුම හදන විට එතනින් ඕනම වෙලාවක යන්න සූදානම්. කැලේ වැවෙන්නේ නැතිව පරිස්සම් කරන්නම් කියලා කිව්වා

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.එච්.කමල් හේවගේ මැතිතුමා

දැනට වාහන නවතාලන ස්ථානයේම ඒ සඳහා අවස්ථාව ලබා දෙන්න.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඒ.සරත් ගුණරත්න මැතිතුමා

අපි මෙම ස්ථානය ගත්තේ නගරය පුළුල් කිරීමේ අරමුණින්. ඒ නිසා අපි තේරුම්ගන්න ඕන මේ ස්ථානය කුමක් සඳහා ඉල්ලන්නේද කියලා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අජිත් කුමාර කරුණාතුංග මැතිතුමා

නගරය ලස්සන කරන්න කියලා හදලා දැන් අවලස්සන කරන්න හදනවා.

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා

අපි මේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරමු. නැත්නම් කලින් ඔතන හිටිය අයගෙනුත් මට ප්‍රශ්නයක් වෙනවා

ඒ අනුව වෑන් රථගාල පවතින ස්ථානය වෙනස් කිරීම සඳහා "යන මැයෙන් යුතුව සභාපති, රියදුරු සංගමය , ඌරගස්මංහන්දිය විසින් ඉදිරිපත් කරන ලදුව සභා ගත කරන ලද ලිපිය පිළිබඳ කරුණු සාකච්ඡා කිරීමෙන් අනතුරුව එම ඉල්ලීම ප්‍රතික්ෂේප විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.සරත් ගුණරත්න මැතිතුමා.

2022 වර්ෂය අවසන් වෙලා 2023 නව වසරක් උදාවෙලා තියෙන්නේ. 2022 කියන්නේ ප්‍රශ්ණ වලට මැදි වූ වසරක්. එක් පසකින් කොරෝනා උවදුරත් අනෙක් පසින් අරගලයත් එක්ක විශාල ප්‍රශ්ණ රැසකට මුහුණ දෙන්න සිදුවුනා අපිට. අපේ රටේ ජනතාව තෙල් පෝලිම් වල දුක් වින්දා. මිනිස් ජීවිත අහිමි වුණා. අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා පත් වුනාට පසුව දැන් ටිකෙන් ටික ප්‍රශ්ණ නිරාකරණය වෙමින් තියෙනවා. 2023 ජනතාවගේ ප්‍රශ්ණ නිමා වෙලා හොඳ රටක් නිර්මාණය වෙනවා . ඒ ගැන කිසි සැකයක් නෑ. සුරංගනා කථාවලට අහුවෙලා මේ රට නැවත ආපස්සට දාන්න එපා කියලා මම ඉල්ලීමක් කරනවා. රටේ ජනතාවගේ අනාගතය සමෘද්ධිමත් කරන්න නම් 2023 වසරේ අපි එකතුවෙලා සහයෝගයෙන් වැඩ කරමු කියමින් උදා වූ නව වසර සැමට සුභ නව වසරක් වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමීර චතුරංග ආරියරත්න මැතිතුමා

2023 නව වසාරේ නව සභා වාරයයි මේ. මේ රටට පසුගිය වසර තුළදී දැඩි ආර්ථික අර්බුදයකට මුහුණ දෙන්න සිදුවුනා. ඒ මුහුණ දීමත් එක්ක ජනතාවගේ  කුසගින්න වැඩිවුණා. එතකොට වෙන්නේ මිනිසුන්ගේ ආගම දර්ශනය නැතිවෙලා යනවා. එහෙම වුණු එක අවස්ථාවක් තමයි සේපාල අමරසිංහ නම් පුදුගලයෙක් අපේ දලදා වහන්සේට අගෞරව කරමින් කරන ප්‍රකාශය.  මේ ත්‍රස්ථවාදී සංගම් විසින් කරන ක්‍රියාවන්. අපි මේ ත්‍රස්ථවාදය හෙලා දැකිය යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රම්‍ය ශ්‍රී විජේතුංග මැතිතුමා

සියලු දෙනාටම සුභ නව වසරක් වේවා. මම සිංහල බෞද්ධයෙක්. අපේ මුදුන් මල්කඩ තමයි දළදා වහන්සේ. නමුත් අපේ මුදුන් මල්කඩවන් ශ්‍රී දළදා වහන්සේට අගෞරව කරමින් සේපාල අමරසිංහ නම් පුද්ගලයෙක් අන්තර්ජාලය හරහා සිදුකරලා තියෙන ක්‍රියාව හේතුවෙන් ජනතාව තුල දැඩි සංවේගයක් ඇති වෙලා තියෙන්නේ.  සිංහල බෞද්ධයෙක් හැටියට මම එය හෙලා දකිනවා.  දේව ධර්මය නොදන්නා නිසයි මෙහෙම තත්වයක් උදාවෙලා තියෙන්නේ. මිනිස්සු අද මූලා වෙලා තියෙන්නේ. දේපල විනාශ කළා. කරන්දෙණියෙ ගම් සභා කීයක් විනාශ කළාද. මගේ තාත්තා හදපු ගම්සභාවත් විනාශ කලා. පසුගිය කාලයේ ගොඩක් දේපල විනාශ කළා. මේකද ප්‍රජාතන්ත්‍රවාදය.මම ඒක හෙලා දකිනවා. මොකද මම විරුද්ධ පාක්ෂිකයෙක්ගේ වත් දේපල විනාශ කිරීම අනුමත කරන්නේ නෑ. මේ රට සිංහල බෞද්ධ, ක්‍රිස්තියානි, මුස්ලිම්, මැලේ කියන සියළුම ජාතීන් සාමූහිකව ජීවත්වෙන්න ඕන  රටක්. අපෙන් සිදුවෙන්න ඕන සියළුම කාර්යයන් අපි ඒ ආකාරයෙන්ම ඉටු කළා. පක්ෂ භේදයෙන් තොරව සභාවට අපෙන් වෙන්න ඕන යුතුකම් අපි සද්භාවයෙන් ඉටු කළා. ලැබු වා වූ නව වසර ගරු සභාපති තුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම් තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ජනමාධ්‍ය වේදීන්ටත්  සුභ නව වසරක් වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.පී . සුභසිංහ මැතිතුමා

ලැබු වා වූ නව වසර ගරු සභාපති තුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම් තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ජනමාධ්‍ය වේදීන්ටත්  සුභ නව වසරක් වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. ශ්‍රී දළදා වහන්සේට අගෞරව කරමින් සේපාල අමරසිංහ නම් පුද්ගලයෙක් අන්තර්ජාලය හරහා සිදුකරලා තියෙනවා.  මම කියන්නේ එම පුද්ගලයා සමග අපේ පක්ෂයේ සම්බන්දයක් නෑ  කියලා.

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා

අපි ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරලා මැතිවරණය කරන්න ඕන. පලාත් පාලන ආයතන කවදා විසුරුවයිද දන්නේ නෑ. අපේ බල  ප්‍රදේශයේ ජනතාවට පීඩාවක් නොවන පරිදි මැතිවරණය කරමු.

07.2. ගෙවීම් වාර්තා සභා සම්මත කිරීම (2022 දෙසැම්බර් මස ගෙවීම් වාර්තා)

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

2022 දෙසැම්බර් මස ගෙවීම් වාර්තාවල අඩු පාඩුවක් තිබේනම් එය පෙන්වා දෙන ලෙසටත් නොමැති නම් සභා සම්මත කරන ලෙසත් ඉල්ලා සිටිනවා.

2022 දෙසැම්බර් මස ගෙවීම් වාර්තාවන්හි අඩු පාඩුවක් නොමැති බැවින් එම වාර්තා අනුමත කිරීම සුදුසු බවටත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලහිරු සඳරුවන් සුරවීර මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

2022 දෙසැම්බර් මස ගෙවීම් වාර්තා සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලහිරු සඳරුවන් සුරවීර මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති එස්.පි.නිමල් බන්දු මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

09.නිමාව

<u>ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා</u>

මෙම සභා වාරයේ වැඩ කටයුතු මෙයින් අවසන් කරනවා.න්‍යාය පත්‍රානුකූලව අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කර ගැනීමට සහය ලබාදුන් සියළුම දෙනාට නැවතත් ස්තුති කරමින් 2023 පෙබරවාරි මස මාසික සභාව 14 දිනට යෙදෙන බවත් එදිනට සියළු දෙනාගේ පැමිණීම ගෞරවයෙන් බලාපොරොත්තු වෙන බවත් කාරුණිකව දන්වා සිටිනවා.

ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා
සභාපති
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව

ගාමිණී අමරවංශ මුණුගොඩ
සභාපති
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව

<u>2022 දෙසැම්බර් මස 15 වන දින මුදල් හා ප්‍රතිපත්ති හා ටෙන්ඩර් කමිටු වර්තාව</u>

දිනය:-2022.12.15

ස්ථානය:-කරන්දෙණිය ප්‍රාදේශීය සභා රැස්වීම ශාලාව.
වෙලාව:- පෙ.ව.9.30

සහභාගි වූ කමිටු සාමාජිකයින්:-

| | | |
|---|---|---|
| 01.ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා | - | ගරු සභාපති |
| 02.එස්.පී.නිමල් බන්දු මැතිතුමා | - | ගරු උප සභාපති |
| 03.රම්‍ය ශ්‍රී විජේතුංග මැතිතුමා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |

ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමා මුදල් කමිටුවට පැමිණීමෙන් අනතුරුව පෙ.ව 9.00 පමණ මුදල් ප්‍රතිපත්ති හා ටෙන්ඩර් කමිටුව ආරම්භ කරන ලදි.

එතුමා විසින් කමිටුවට පැමිණි සියලුම ප්‍රාදේශීය සභා මන්ත්‍රිවරු සහ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය පිළිගන්නා ලදි.

ලේකම්තුමිය විසින් මුදල් කමිටුවට ඉදිරිපත් වී ඇති ලිපි ලේඛන ගරු සභාපතිතුමා වෙත ඉදිරිපත් කරන ලදි.

01.2022.01.03 දින විවෘත කිරිමට නියමිත ඌරගස්මංහන්දිය නව වෙළඳ සංකීර්ණය විවෘත කිරීමේ උත්සවය පැවැත්විය යුත්තේ කුමන ආකාරයෙන්ද යන්න සාකච්ඡා කිරීම එදින මුදල් කමිටුවේ ප්‍රධාන මාතෘකාව වූ අතර එදිනට අඩුආදායම්ලාභී පවුල් සඳහා ලබාදෙන පොත් කට්ටල ලබාදීම සුදුසු බවටද එදින මුදල් කමිටුව තීරණය කරන ලදි.

02.ඌරගස්මංහන්දිය වටරවුම ඉදිකිරීම සඳහා ඉවත් කරන ලද කඩ කාමර වෙනුවට ඌරගස්මංහන්දිය නව වෙළඳ සංකීර්ණයේ ඉහල මාලයේ කඩ කාමර අංක 03ත් 04ත් පහළ මාලයේ කඩ කාමර 03ත් 04ත් බදු පදනම මත ලබාගෙන ඇති කඩ කාමර හිමියන් සඳහා එම කඩකාමර වල යතුරු ලබාදීම සුදුසු බවත් එම කඩ කාමර සඳහා ගෙවිය යුතු හිඟ එක්වන් මුදල ගෙවීම සඳහා මාස 06ක සහන කාලයක් ලබාදිම සුදුසු බවත් මුදල් කමිටුව තීරණය කරන ලදි.

03.ඌරගස්මංහන්දිය වෙළඳ සංකීර්ණයේ ඉදිරිපස කැටගල් ඇල්ලීම කඩිනමින් සිදු කළ යුතු බැවින් ඒ සඳහා සකසන ලද ඇස්තමේන්තුව මුදල් කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කරන ලදි. එම ඇස්තමේන්තු මුදල අනුවම එම කර්මාන්තය සිදු කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මුදල් කමිටුව තීරණය කරන ලදි.

ඌරගස්මංහන්දිය නව වෙළඳ සංකීර්ණය ඉදිරිපිට කැටගල් ඇල්ලීම

ඇස්තමේන්තු මුදල - රු.950,000.00

ඉහත අංක 01 සිට 03 දක්වා සඳහන් තීරණ ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2022.12.15 දින පැවති මුදල් කමිටුවේදී ගන්නා ලද තීරණ බව සහතික කරමි.

පී.එච්.ටී.කේ.හේමචන්ද්‍ර,
ලේකම්,
කරන්දෙණිය ප්‍රාදේශිය සභාව.

පී.එච්. තෙල්මා කුමාරි හේමචන්ද්‍ර
ලේකම්
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව

## 2022 දෙසැම්බර් මස 30 වන දින මුදල් හා ප්‍රතිපත්ති හා ටෙන්ඩර් කමිටු වර්තාව

දිනය:-2022.12.30

ස්ථානය:-කරන්දෙණිය ප්‍රාදේශීය සභා රැස්වීම ශාලාව.
වෙලාව:- පෙ.ව.9.30

සහභාගි වූ කමිටු සාමාජිකයින්:-

| | | |
|---|---|---|
| 01.ගාමිණි අමරවංශ මුණුගොඩ මැතිතුමා | - | ගරු සභාපති |
| 02.එස්.පී.නිමල් බන්දු මැතිතුමා | - | ගරු උප සභාපති |
| 03.ඩී.කේ.ජිවන්ති වීරසිංහ මැතිනිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 04.ශ්‍යාමා නිශාන්ති විමලවීර මැතිනිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 05.පී.එච්.සුරේෂ් සම්පත් කුමාර මැතිතුමා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |

ගරු සභාපති ගාමිණි අමරවංශ මුණුගොඩ මැතිතුමා මුදල් කමිටුවට පැමිණීමෙන් අනතුරුව පෙ.ව 9.00 පමණ මුදල් ප්‍රතිපත්ති හා ටෙන්ඩර් කමිටුව ආරම්භ කරන ලදි.

එතුමා විසින් කමිටුවට පැමිණි සියලුම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු සහ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය පිළිගන්නා ලදි.

ලේකම්තුමිය විසින් මුදල් කමිටුවට ඉදිරිපත් වී ඇති ලිපි ලේඛන ගරු සභාපතිතුමා වෙත ඉදිරිපත් කරන ලදි.

01.SPZA 5319 මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ කැපුම්තල යුගල හා නට් බෝල්ට් 20ක් සවිකර අළුත්වැඩියා කිරීම හා ප්‍රවාහනය වෙනුවෙන් ගෙවිය යුතු මුදලද ඇතුළුව JSB TRADING (PVT)LTD ආයතනය වෙත ගෙවිය යුතු රුපියල් 74,000.00ක මුදල එම ආයතනය වෙත ගෙවීම සුදුසු බවට මුදල් කමිටුව තීරණය කරන ලදි.

02. SPZA 5319 මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ ගෙවීඇති එයාර් ප්ලේට් වෙනුවට නව එයාර් ප්ලේට් සවිකර අළුත්වැඩියාව හා ප්‍රවාහනය වෙනුවෙන් JSB TRADING (PVT)LTD ආයතනය වෙත ගෙවිය යුතු රුපියල් 31,000.00ක මුදල එම ආයතනය වෙත ගෙවීම සුදුසු බවට මුදල් කමිටුව තීරණය කරන ලදි.

03.ඌරගස්මංහන්දිය පැරණි සමුපකාර ගොඩනැගිල්ල ඉවත් කර සාදන ලද නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර අංක 01 ටෙන්ඩර් මගින් ලබාගෙන ඇති ඌරගස්මංහන්දිය ,මාගල පාර පදිංචි තරිඳු කේෂාන් මයා එක්වන් මුදලින් $\frac{1}{4}$ක් ගෙවා ඇති අතර දෙවෙනි වාරිකය ගෙවීම සඳහා මාස 06ක් කාලයක් ඉල්ලා දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විලී ගමගේ මැතිතුමා වෙතින් කරන ලද ඉල්ලීම පරිදි ඒ සඳහා මාස 06ක කාලයක් ලබාදෙන ලෙස ප්‍රාදේශිය සභාවෙන් ඉල්ලීම් කර ඇත. සියළු මුදල් ගෙවීමෙන් පසු යතුරු භාර ගැනිමට එම පුද්ගලයා එකඟ නොවූ බැවින් ඒ සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා මාසික සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බවට මුදල් කමිටුව තීරණය කරන ලදි.

04.ඌරගස්මංහන්දිය නගරයේ යෝජිත වටරවුම සැකසීමට පුළුල් කළ බිම් කොටස ආශ්‍රිත භූමිය සඳහා ඌරගස්මංහන්දිය කර්මාන්ත පුරයේ රුහුණු මෙටල් ක්‍රෂර් ආයතනය වෙතින් ලබාගත් ABC ගල් සඳහා ලබාදිය යුතු රුපියල් 62500.00ක මුදල එම ආයතනය වෙත ලබාදිම සුදුසු බවට මුදල් කමිටුව තීරණය කරන ලදි.

05.අඩුආදායම් ලාභී පවුල් සඳහා පොත් කට්ටල් බෙදා දිම සඳහා රුපියල් ලක්ෂ 20ක මුදල් අනුමත වී තිබුනද ඒ සඳහා රුපියල් 1,590,000.00 පමණක් වැය වී ඇති බැවින් රුපියල් ලක්ෂ විස්සෙන් ඉතිරි රුපියල් 410,000.00ක මුදලට සරිලන පරිදි නැවත එම ආයතනයෙන්ම පොත් කට්ටල් 250ක් මිලදී ගැනිම සුදුසු බවට මුදල් කමිටුව තීරණය කරන ලදි.

06.මහජ්දණ්ඩ වැසිකිළියේ කරන්දෙණිය ප්‍රාදේශිය සභාව ලෙස සඳහන් $4^1 X3^1$ ප්‍රමාණයේ සයිඩ බෝඩ් (SILVER MIRROR අකුරු) 01ක් සකස් කිරිම සඳහා ලැබී ඇති මිල ගණන් අතරින් රු 65000.00ක අවම මිලගණන් ලැබී ඇති සමාරා අයාතනයෙන් සකස් කිරිම සුදුසු බවට තීරණය කරන ලදි.

07.ඌරගස්මංහන්දිය නව වෙළඳ සංකීර්ණය එම්.එච්.ගුණරත්න වීරකෝන් වෙළඳ සංකීර්ණය ලෙස නම් කිරිම සඳහා භාෂා ද්විත්වයෙන් සකසන ලද දිග $10^1 X2\frac{1}{4}$ සහිත SILVER MIRROR අකුරු සවි කිරිමට කැඳවන ලද

මිල ගණන් අතරින් රුපියල් 95000.00ක අවම මුදල ලබාදී ඇති සමාරා ආයතනයෙන් එම අකුරු සකස් කර ගැනීම සුදුසු බවට මුදල් කමිටුව තීරණය කරන ලදී.

08.මහජ්දණ්ඩ සණස ඉදිරිපිට සහ ඌරගස්මංහන්දිය නව වෙළඳ සංකීර්ණය ඉදිරිපිට ඇල්ලීම සඳහා අවශ්‍ය ස්ලැබ් කැලි මිලදී ගැනීම සුදුසු බවත් එම ස්ලැබ් කැලි 01ක් රුපියල් 7935.00ක අවම මිල ගණන් යටතේ KDAW ආයතනය වෙතින් මිලදී ගැනීම සුදුසු බවට මුදල් කමිටුව තීරණය කරන ලදී.

09.මහජ්දණ්ඩ පොදු වැසිකිළිය විවෘත කිරිම සඳහා සකසන ලද අඩි 4ක් දිග අඩි 2ක් පළල සමරු ඵලකය සැකසීම සඳහා වියදම් වූ රුපියල් 51500.00 මුදල චිත්‍රා ගල් කැටයම් වෙත ලබාදීම සුදුසු බවට මුදල් කමිටුව තීරණය කරන ලදී.

10.ඌරගස්මංහන්දිය නව වෙළඳ සංකීරණය විවෘත කිරීම සඳහා සකසන ලද අඩි $3\frac{1}{2}$ දිග අඩි 3පළල සමරු ඵලකය සැකසීම සඳහා වියදම් වූ රුපියල් 80,000.00 ක මුදල චිත්‍රා ගල් කැටයම් වෙත ලබාදීම සුදුසු බවට මුදල් කමිටුව තීරණය කරන ලදී.

11.ඌරගස්මංහන්දිය වෙළඳ සංකීර්ණයේ කඩ කාමර අංක 02 ටෙන්ඩර් මගින් ලබාගෙන ඇති ටී.එච්.දීපාල් චන්දික ගුණරත්න මයා එහි එක්වන් මුදල් වශයෙන් ගෙවිය යුතු රුපියල් 5,700,000.00ක මුදලින් රුපියල් 2000,000.00ක් ගෙවා ,ගෙවිය යුතු ඉතිරි මුදල 2023.04.30ට පෙර ගෙවන බවට පොරොන්දු වී ඇති බැවින් ඒ සඳහා අවස්ථාව ලබාදීම සුදුසු බවත් සම්පූර්ණ මුදල ගෙවීමෙන් අනතුරුව කඩ කාමරයේ යතුර භාර දීම සුදුසු බවත් මුදල් කමිටුව තීරණය කරන ලදී.

12.භාවිතයෙන් ඉවත් කරන ලද හයිඩ්‍රොපික් ඔයිල් විකණීම සඳහා කැඳවන ලද මිල ගණන් අතරින් රුපියල් 300ක උපරිම මිලක් ලැබා දි ඇති ඌරගස්මංහන්දිය,කුරුඳුගහකන්ද ගහන සර්විස් සෙන්ටර් වෙත ඒම ඔයිල් ලබාදිම සුදුසු බවට මුදල් කමිටුව තීරණය කරන ලදී.

ඉහත අංක 01 සිට 12 දක්වා සඳහන් තීරණ ගරු සභාපති ගාමිණී අමරවංශ මුණුගොඩ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2022.12.30 දින පැවති මුදල් කමිටුවේදී ගන්නා ලද තීරණ බව සහතික කරමි.

පී.එච්.ටී.කේ.හේමචන්ද්‍ර,
ලේකම්,
කරන්දෙණිය ප්‍රාදේශිය සභාව.

පී.එච්. තෙල්මා කුමාරි හේමචන්ද්‍ර
ලේකම්
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව